**කොවිඩ් 19 සති පාසල සබරගමු පළාත**

9 ශ්‍රේණිය - පුරවැසි අධ්‍යාපනය

**ඒකකය 9.1 -** ජන සමාජයේ සුරක්ෂිත පැවැත්ම සඳහා ක්‍රියාකාරීව කටයුතු කිරීම

**1 වන සතිය** 2021 පළමු වාරය ආරම්භය

**ක්‍රියාකාරකම 9. 1. 1** - සමාජ සුරක්ෂිතතාව කෙරෙහි දායක වන ආයතන පිළිබඳ විමර්ශනය කරයි.

**හැඳින්වීම -** නමය ශ්‍රේණියට පිවිසි ඔබට පුරවැසි අධ්‍යාපනය ප්‍රථම පාඩම ලෙස හදාරන්නට ලැබෙන්නේ සමාජ සුරක්ෂිතතාවයයි. බියෙන් හා සැකයෙන් තොරව පුද්ගලයාට සමාජයේ සාමාජිකයෙකු ලෙස ජීවත්වීමට ලැබෙන රැකවරණය සමාජ සුරක්ෂිතතාවයයි.

**ක්‍රියාකාරකම් සඳහා සිසුන්ට උපදෙස් : -**

පියවර 1 : - පෙළ පොතේ පිටුවක් 1-10 දක්වා අවබෝධයෙන් කියවන්න

පියවර 2 : - අභ්‍යාස පොත භාවිතා කරගෙන ප්‍රශ්න ලියා පිළිතුරු සපයන්න.

**ප්‍රශ්නාවලිය**

1. සමාජය යනු කුමක්ද?
2. සමාජ සුරක්ෂිතතාව යනු කුමක්ද?
3. සමාජ සුරක්ෂිතතාව කෙරෙහි බලපාන ආයතන මොනවාද?
4. එම ආයතන තුළින් ඉටු කරන කාර්යයන් දෙක බැගින් ලියන්න.
5. සමාජ ආයතන සංවිධාන පහක් නම් කරන්න.
6. සමාජ විරෝධී ක්‍රියා මැඩ පැවැත්වීම හා සමාජ සුරක්ෂිතතාව තහවුරු කිරීම සඳහා ක්‍රියාත්මක වන ආයතන මොනවාද නිදසුන් හතරක් දක්වන්න.

**පසු වැඩ**

සමාජ සුරක්ෂිතතාව කෙරෙහි දායක වූ පුද්ගලයෝ එනම් ඒබ්‍රහම් ලින්කන්, තෝමස් අල්වා එඩිසන්, මර්සලින් ජයකොඩි පියතුමා වැනි අය ආදර්ශමත් වීමට හේතු මොනවාද? පාසල ආරම්භ වූ වහාම මෙම අභ්‍යාසය පුරවැසි අධ්‍යාපනය විෂයභාර ගුරුභවතාට පෙන්වීමට සලස්වන්න.

ර/ ශ්‍රී රත්නාකර මහා විද්‍යාලයේ

පුරවැසි අධ්‍යාපන විෂය භාර

ආචාර්ය එම්.ඒ.පත්මලතා මිය